ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය
---------------------------------

01. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 21 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 14 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 අහිතකර මතය

මෙම වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 අහිතකර මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වරිපනම් බදු ලේඛන ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු රු.2,425,881 ක් වුවද ශේෂ පත්‍රයේ රු.4,323,778 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.1,897,897 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වරිපනම් ශේෂය හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | වරිපනම් තක්සේරු කර ඇති ආකාරය නිසා ගැටළු ඇතිවී ඇත. |
| (ii) | සේවක ඇප තැන්පත් රු.71,583 ක් ජංගම වගකීම්වල දක්වා තිබුණද ඊට අනුරූපීව දැක්විය යුතු සේවක ඇප තැන්පත් ආයෝජනය ගිණුම්ගත කර නොතිබුණි. | සේවක ඇප තැන්පත් ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |

(ආ) අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂවල සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කර තිබුණු පොකුණු ව්‍යාපෘතිවලට අදාලව තවදුරටත් ගෙවිය යුතු රු.4,245,707 ක් හා ඒ මත 2012 මාර්තු 01 න් පසුව ජනිත වන නෛතික පොලිය අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | නඩු දිනය 2020.10.12 බැවින් නෛතික පොලිය හා වාරික මුදල ගණනය කිරීම ගැටළුවකි. |

(ඇ) නොසැසඳුනු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් උපලේඛනය අනුව 3,471,153 ක්ද, වරිපනම් ලේඛනය අනුව 2,425,881 ක්ද හා වරිපනම් සඳහා භාවිතා කරනු ලබන මෘදුකාංගය අනුව රු.5,195,243 ක්ද විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපලේඛනය අනුව ඉදිරියට ගෙවූ වරිපනම් ශේෂය රු.27,755 ක් වුවද ශේෂ පත්‍රයේ රු.135,629 ලෙස දැක්වීම නිසා රු.107,874 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු සපයා නැත. |
| (iii) | 2019 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් හා සංචිත ශේෂය ලෙජරය අනුව රු.228,552,457 ක් වුවත් ශේෂ පත්‍රයේ රු.134,331,585 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.94,220,872 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සේවක ණය උපලේඛන අනුව රු.3,837,733 ක්ද, ශේෂ පත්‍රය අනුව රු.3,752,315 ක්ද හා සේවක ණය ලේඛනය අනුව රු.3,738,982 ක්ද විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | උපලේඛන ආරම්භක ශේෂය වැරදී ඇත. |
| (v) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් ලේඛන අනුව වටිනාකම රු.210,000 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.1,902,295 ක් ලෙස දක්වා තිබීම නිසා රු.1,692,295 ක එකතු වෙනසක් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | කොන්ත්‍රාත් තැන්පත් සහ මස් කඩ ඇප තැන්පත් වෙන වෙනම සටහන් කර ඇත. තැන්පත් ලේඛනයේ පවතින රු.17,789 ක් ශේෂය වසර 07 සිට පැවත එන අතර එය හඳුනාගත නොහැක. |

| | | | |
|---|---|---|---|
| (vi) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු ශේෂ පත්‍රයේ ශුද්ධ වත්කම් වටිනාකම රු.230,032,607 ක් වුවද හිමිකම් වටිනාකම රු.134,331,585 ක් ලෙස දක්වා තිබුණු බැවින් වත්කම් හා හිමිකම් රු.95,701,022 කින් අසමාන විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල සමුච්චය වෙමින් පවතින වර්ෂයේ ගිණුම් අතර හුවමාරු ලෙස දැක්වෙන රු.1,130,292 ක අවිනිශ්චිත ගිණුම් ශේෂය පිළිබඳව සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුනොකර සමාලෝචිත වර්ෂයේදී ජ'නල් සටහන් මගින් සමුච්චිත අරමුදලට ගැළපීම් කර තිබුණි. | ඒ පිළිබඳ සොයාබලා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුවේ. | (i) 2017 හා 2018 වර්ෂවල ගිණුම් අතර හුවමාරුව 1130292 මුදල පොදු ගිණුමෙන් ගෙවිය යුතු කර්මාන්තයක් සඳහා කර්මාන්ත ගිණුමෙන් ගෙවා ඇත. නැවත පොදු ගිණුමෙන් චෙක්පතක් ලියා කර්මාන්ත ගිණුමට දමා ඇත.<br>(ii) ශුද්ධ වත්කම් හා හිමිකම් අතර 95701022 ක වෙනස අවිනිශ්චිත ගිණුම ශේෂය ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඉ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(i) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 05 ක් ඉක්මවූ කාලයක සිට අයනොවී පැවතුණ ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක වටිනාකම රු.65,960 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අත්තිකාරම් කොන්ත්‍රාත් හා අත්තිකාරම් ශේෂ සොයාගත නොහැක. |

(ii) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 05 ක් ඉක්මවූ කාලයක සිට නිරවුල් නොකර පවතින ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක වටිනාකම රු.965,926 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | නොගෙවූ විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සෑම අවුරුද්දකම ගෙවාගෙන යනු ලැබේ. මෙහි අර්ධ වාර්ෂිකව රු.50,000 ක මුදල ගෙවීම සිදු කරනු ලැබේ. මුද්දර බද්ද රු.292,928 ක මුදල 2020 වර්ෂයේ ගෙවීමට කටයුතු කරමි. |

(ඊ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.202,250,694 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි |

1.4 අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උපවගන්තිය | | වාර්ෂික කාර්ය සාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | පනත අනුව කටයුතු කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශනවල පිටු අංක 111 සිට 126 දක්වා ඉදිරිපත් කර ඇත. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | | | |
| | (i) රීති 59 | | 2019 වර්ෂය සඳහා කර්මාන්ත හා ව්‍යාපාර සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | රීති අනුව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා කර්මාන්ත හා ව්‍යාපාර සම්බන්ධයෙන් සිදුකර ඉදිරිපත් කර ලේඛනයක් සකස් කර ඇතත් අඩුපාඩු පවතින බව පිළිගනිමි. |
| | (ii) රීති 65 | | කර්මාන්ත හා ව්‍යාපාර බදු ගෙවීම සඳහා වූ කාල සීමාව අවසානයේ ගෙවීම් පැහැරහරින අයගේ නාම ලේඛන පිළියෙල කර නොතිබුණි. | රීති අනුව කටයුතු කළ යුතුවේ. | ව්‍යාපාර බදු ගෙවීම සඳහා වූ කාල සීමාව අවසානයේ ගෙවීම් පැහැර හරින අයගේ ලේඛනයක් සභාව තුළ පවත්වාගෙන යාමට ලිඛිත උපදෙස් ලබාදී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | රීති අංක 99 | 4,135,029 | 2019 මැයි සිට නොවැම්බර් දක්වා ගෙවීම් වවුචර් 56 ක් සඳහා විධිමත් අනුමැතියක් සහ සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | ප්‍රාදේශීය සභා රීති සංග්‍රහය අනුව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (iv) | රීති 168(1) | | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 28 දින ඉදිරිපත් කර තිබුණි. | රීති අනුව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |
| (v) | රීති 217 හා 218 | | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රා.ස. 46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරික්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති අනුව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි<br>------------------ | | | | |
| (i) | 1645 | | සභාවේ වාහනවලට අදාලව ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |
| (ii) | 1647(ඉ) | | වාහන ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | වාහන ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි. |

02. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,063,934 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,769,582 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 2,064,067 | 2,448,142 | 5,003,790 | 3,512,229 | 2,072,920 | 2,433,317 | 2,024,217 | 5,387,865 |
| (ii) | කුලී | 6,440,000 | 5,037,031 | 1,498,739 | 4,998,431 | 5,557,250 | 5,410,420 | 5,666,955 | 95,770 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 3,380,900 | 5,133,905 | 1,595,755 | 5,283,155 | 5,331,000 | 4,546,902 | 4,389,652 | 157,250 |
| (iv) | වෙනත් ආදායම් | 6,671,000 | 9,638,588 | 4,304,239 | 10,431,920 | 3,158,000 | 7,104,001 | 2,155,270 | 7,271,827 |
| | | 18,555,967 | 22,257,666 | 9,211,013 | 24,225,735 | 16,119,170 | 19,494,640 | 14,236,094 | 12,912,712 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට රැස්කළ යුතු සමස්ථ ආදායම රු.35,170,378 ක් වුවද එම ආදායමින් රු.24,225,735 ක් වු සියයට 69 ක් පමණක් රැස්කර තිබුණි. | සභාවේ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ වරිපනම් අයකරන බලප්‍රදේශ හඳුනාගෙන ගැසට් කර නොතිබුණි. | වරිපනම් අයකරන බලප්‍රදේශ හඳුනාගෙන ගැසට් නිවේදන පලකළ යුතුවේ. | ගලෙන්බිදුණුවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් ලෙස නිශ්චිත කර නොමැත. නමුත් අතීතයේ සිට වරිපනම් අය කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් අයකිරීම 2014 වර්ෂයේ තක්සේරුව පදනම්ව සිදුකර තිබුණු අතර අදාළ වර්ෂයට පසු නව ඉදිකිරීම් හා වෙනස්කිරීම් සම්බන්ධව තාවකාලික තක්සේරු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | නව ඉදිකිරීම් හා වෙනස් කිරීම් හඳුනාගෙන තාවකාලික තක්සේරු ලබාගෙන වරිපනම් අයකළ යුතුවේ. | පිළිගනිමි. |
| (ඇ) | හිඟ වරිපනම් සම්බන්ධ කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. | හිඟහිටි වරිපනම් සඳහා කාල විශ්ලේෂණය ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ඈ) | වරිපනම් නිදහස් ඒකක ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | වරිපනම් නිදහස් ඒකක ලැයිස්තුවක් පිළියෙල කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ඉ) | 2014 වර්ෂයේ තක්සේරුව පදනම්ව බිල්කිරීම රු.1,857,782 වූ අතර 2019 දෙසැම්බර් 31 දිනට හිඟය රු.3,469,479 ක් විය. නමුත් වරිපනම් ලේඛනය අනුව හිඟය රු.5,387,865 ක් විය. | නිවැරදිව හිඟහිටි වරිපනම් හඳුනාගෙන අය කළ යුතුවේ. | හිඟ ශේෂය රු.2,425,881 ක් බව සහතික කරමි. |

03. මෙහෙයුම් සමාලෝචනය
-------------------------

3.1 කාර්ය සාධනය
-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වූ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට අදාළ කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අවශ්‍ය කරුණු සඳහා අතුරු ව්‍යවස්ථා සැකසීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

(ආ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ------------- | --------------------------- |
| සමාලෝචිත වර්ෂයට ප්‍රතිපාදන වෙන්වූ රු.5,250,000 ක් වටිනා ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘති නියමිත කාලය තුළ අවසන් කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. නිරීක්ෂණයේ සඳහන් ව්‍යාපෘති සම්බන්ධව රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්ති තීරණ මත සංවර්ධන ව්‍යාපෘතිවලින් පළමු අදියරේ 15% ද දෙවන අදියරේ 10% ද කපා හරින ලදි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ------------- | --------------------------- |
| එක්සත් ජාතින්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව සමාලෝචිත වර්ෂය තුළදීද දැනුවත් වී නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකල යුතුවේ. | මෙම තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් දැනට ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක වන අතර අපගේ විෂය පථය පිළිබඳ විශේෂ පුහුණු ඉදිරියේදී සිදුකරන බව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | --------------------------- |
| (අ) | ධාවනයේ පවතින වාහන 12 කට 2019 වර්ෂය සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | සභාව සතු වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගත යුතුවේ. | පිළිගනිමි. |
| (ආ) | අනියම් හා තාවකාලික සේවකයන් සඳහා 2007 සහ 2014 වර්ෂවල සේවක භාරකාර අරමුදලට දායක මුදල් නොගෙවීම නිසා අධිභාර වශයෙන් රු.18,486 ක් ගෙවා තිබුණි. | අර්ධ වාර්ෂික වාර්තා ප්‍රමාද කිරීම සිදුකළ සහ ගෙවීම් අනුමත කළ පාර්ශවයන්ගෙන් අයකරගත යුතුවේ. | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට යැවිය යුතු අර්ධ වාර්ෂික වාර්තා ප්‍රමාද වීම නිසා ප්‍රමාද ගාස්තු ගෙවිය යුතු බවට දන්වා එවා ඇත. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 පවරානොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාව විසින් භාවිතා කරනු ලබන රු.76,322,855 ක් වටිනා වාහන 18 ක අයිතිය පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | 1999 – 2000 වර්ෂවල ප්‍රාදේශීය සභා ක්‍රියාත්මක කරන ලද පොකුණු නඩු වාර්තාවට අනුව ප්‍රාදේශීය සභාවේ ඇති වත්කම් වෙන්දේසියට ලක්කර ඇත. මෙම ගෙවීම් කටයුතු තවම අවසන් වී නොමැති අතර, මේ හේතු නිසා මෙම වත්කම් තවම ප්‍රාදේශීය සභාවට පවරාගෙන නොමැත. |

3.3.2 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අබලන්වී තිබෙන කඩ කාමරයක් අලුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීමෙන් බදු දීමට නොහැකිවීතිබුණි. | අවශ්‍ය අළුත්වැඩියා සිදුකර බදුදීමට කටයුතු කළ යුතුවේ. | මෙම භූමිය තුළ නවීන පහසුකම් සහිතව කඩ කාමර ඉදිකිරීමට සංවර්ධන යෝජනාවලට ඇතුළත් කර ඇත. |
| (ආ) | සභා පරිශ්‍රයේ රදවා තිබෙන රු.1,322,000 ක් වටිනා වාහන 02 ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනය විසින් පෙන්වාදී ඇති වාහනය අළුත්වැඩියා කර දැනට භාවිතයේ පවතී. 149/6438 දරන යතුරු පැදිය පොකුණු ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අධිකරණය විසින් නඩු භාණ්ඩයක් ලෙස ලේඛනගත කර ඇත. |
| (ඇ) | වටිනාකම රු.3,452,403 ක් වූ ජල නල තොගය වර්ෂ 05 ක් ඉක්මවූ කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | ජල නල තොගය ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා භාවිතා කළ යුතුවේ. | මෙම ජලනල තොගයෙන් ඉතිරි බට තොගය ගිණුම් කාරක සභාවේ දී ඇති උපදෙස් පරිදි වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

3.3.3 වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය අනුව වට්ටෝරු ලේඛනවල නොමැති අයිතම 102 ක් හඳුනාගෙන තිබුණි. එසේම 2014 සහ 2016 වර්ෂවලදී සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුවේ. භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් නිවැරදිව සටහන් කළ යුතුවේ. | පිළිගනිමි. |

3.4 ප්‍රසම්පාදනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 උපවගන්තිය ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ අවම කාල සීමාව දින 21 වුවද 2019 වර්ෂයට වත්කම් බදුදීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමට දින 16 ක් පමණක් ලබාදී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුවේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 උපවගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට නොහැකි වූයේ අදාළ ගැසට් නිවේදනය මහ සභාවෙන් අනුමත කර ගැනීමට නොහැකි වූ ප්‍රමාද දෝෂයක් හේතුවෙනි. |
| (ආ) | 1980 දෙසැම්බර් 31 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාරව කඩකාමර වසර 05 කට වරක් තක්සේරු කළයුතු වුවත් කඩකාමර 35 ක් තක්සේරු කිරීමකින් තොරව අවම ලංසු මුදලක් තීරණය කර ටෙන්ඩර් කර තිබුණි. | කඩ කාමර තක්සේරු කර බදුදිය යුතුවේ. | පිළිතුරු සපයා නැත. |
| (ඇ) | අවම ලංසු වටිනාකම් එකතුව රු.24,000 ක්වූ කඩකාමර 08 ක් ටෙන්ඩර් නොකර සභා තීරණයක් මත බදුදී තිබුණි. | කඩ කාමර බදු දීමේදී විනිවිදභාවයකින් යුතු කළ යුතුවේ. | පිළිතුරු සපයා නැත. |

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

------------------------------------------

අභ්‍යන්තර විගණනය

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------- | --------------------------- |
| උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව සභාවට වගකියනු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත් කර විගණනය සිදුකළ යුතුවේ. | පිළිතුරු සපයා නැත. |